# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/18 - 2013 ජූනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කරනු ලබන නිවේදනය**

මෑත අතීතයේ දී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් තැනැත්තන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ බැවින් ද,

02. 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වගන්තියට අනුව.-

2.1 අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හෝ අවතැන් වී සිටි තැනැත්තෙකු වූ ද,

2.2 2009 වර්ෂය අවසන් වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත් වන්නා වූ ද,

2.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාමලේඛනයක තමාගේ නම ඇතුලත් කර නොමැති වූ ද,

යන කරුණු නිශ්චිතව ඔප්පු කරනු ලැබීම මත සහ ඉල්ලුම්කරු අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බව දැනට පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 දිනට පෙර තමා ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම ලියාපදිංචිකර ගැනීම සඳහා අදාල මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් කිරීමට ඉහත කී පනතෙන් හිමිකම් ලබා දී ඇති බැවින් ද,

03. ඉහත සඳහන් විශේෂ විධිවිධාන පනතේ 3 වැනි වගන්තියට අනුව ඉහත 2 ඡේදයේ සඳහන් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් වූ.-

3.1 අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ දිනයේ දී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූ ද, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.2 එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවකු බවට පත් වීමෙන් පසුව ඉපදී ඉල්ලීම් කරනු ලබන අවස්ථාවේ දී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද,

3.3 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත්ව නැත්තා වූ ද,


1A - G 017839 — 320 (2013/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තැනැත්තන්ට උප්පැන්න සහතිකය සහ ග්‍රාම නිලධාරී විසින් ඉහත සඳහන් කරුණු සනාථ කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 දිනට පෙර තමා/තම දෙමව්පියන් අවතැන්වූවකු බවට පත්වීමට පෙර ස්ථිරව පදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලබා දී ඇති බැවින් ද,

04. 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත 02 සහ 03 ඡේදවල සඳහන් සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගේ නම් ඇතුළත් කොට 2012 වර්ෂය සඳහා උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවෙන් පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කිරීම සඳහා ඉල්ලුම්පත් භාරගැනීම, 2013 ජුනි මස 22 වැනි දින ආරම්භ කොට 2013 ජුනි මස 28 වැනි දින අවසන් කරන බවත්, අදාළ ඉල්ලුම්පත්‍ර දිවයිනේ සියළුම මැතිවරණ කොට්ඨාසවල ලියාපදිංචි කිරීමේ නිලධාරී කාර්යාල වලින් ලබාගත හැකි බවත්, නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි මැතිවරණ කොට්ඨාසවල (යාපනය, වවුනියාව, මඩකලපුව, දිගාමඩුල්ල, ත්‍රිකුණාමලය) ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලෙසත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

05. 04 ඡේදයේ සඳහන් පරිපූරක ලැයිස්තුව සකස් කිරීම ජුනි මස 28 වැනි දින අවසන් කර ඒ පිළිබඳ නිවේදන ජුනි මස 29 වැනි දින නිකුත් කිරීමට අපේක්ෂිත බවත්, එම ලැයිස්තුවට නම් ඇතුළත් නොවූ ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන්ට ස්වකීය නම් පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමට එදින සිට දින 07ක අමතර කාලසීමාවක් ලබා දීමට අපේක්ෂිත බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2013 ජුනි මස 21 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

07-190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.